සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

**වර්ෂ අවසාන ඇගයීම**
ஆண்டிறுதி மதிப்பீடு - 2018
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

**සැලකිය යුතුයි:**

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු **40කි.**

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ **වඩාත් ගැළපෙන** පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

Department of Education - Western Province

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන් මුද්‍රිත** කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වචනය තෝරන්න.

(01) වැඩ වර්ජනයට සහභාගීවූවන් **එක් එල්ලේ** චෝදනා කළේ පාලක පක්ෂයටයි.
(1) එල්ලය බලා (2) ඍජුවම (3) ඉලක්කයට (4) නිවැරදිම

(02) නගරයේ ජීවත්වීමට යාමෙන් පසු සිරියාවතී **අළු ගසා දමා** ඇති බව ගම්මු පවසති.
(1) දර ළිපේ ඉවීම නවතා (2) ගම අමතක කර
(3) බොහෝ සෙයින් හැඩවී (4) දිළිඳු නෑයන් ඈත් කර

(03) වගඋත්තරකරුවන් ඉදිරිපත් කළ සියලු ලේඛන කුඨ නිලධාරීන් විසින් **අකාමකා දමන** ලද බව පැතිරෙන්නට විය.
(1) ඉවත දමන (2) අනිසි ලෙස යොදන
(3) විනාශ කරන (4) යොදාගන්නා

- අංක 04 සිට 07 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැනට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

(04) සිංහල භාෂාවේ ඉතිහාසය හැදෑරීමේ දී දම්පියා අටුවා ගැටපදය ප්‍රබල .....................................වේ.
(1) මූලාශ්‍රයක් (2) සාක්ෂියක් (3) නිදර්ශනයක් (4) යථාර්ථයක්

(05) ලෝකයේ නව සාහිත්‍ය ප්‍රවණතා ............................................ කරමින් නූතන සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයට එක්වූ ලේඛකයෝ බොහෝ වෙති.
(1) ගවේෂණය (2) නිරීක්ෂණය (3) උපකල්පනය (4) අධීක්ෂණය

(06) ලංකාවේ නිදහස් අධ්‍යාපන ක්‍රමයක් ප්‍රතිෂ්ඨාපනය කිරීම උදෙසා කන්නන්ගර මැතිතුමා ................................................ සේවයක් ඉටු කළේ ය.
(1) අනූපමේය (2) අප්‍රතිහත (4) අසමාන (4) අත්‍යුදාර

(07) නිර්මාණ කාර්යය යනු කලාකරුවා සිය අත්දැකීම් ඇසුරෙන් තමා ලද ................................ අනායයන් වෙත ඉදිරිපත් කිරීමකි.

(1) අත්දැකීම් (2) වින්දනය (3) දැනුම (4) ශිල්පය

(08) සව් ඉසුරු, සස්පල, සුසිරිත, සබබස, සිරිය යන පද පද අකාරාදි පිළිවෙළට සැකසූ විට මුලින්ම යෙදෙන පදය කුමක් ද?

(1) සස්පල (2) සව්ඉසුරු (3) සිරිය (4) සබවාස

(09) මහාප්‍රාණ, ඝෝෂාක්ෂර පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ඛ , ඡ, ඨ, ඪ (2) ස, ඣ, ඪ, භ (3) ශ. ෂ . ස , ෆ (4) ප, ඵ, බ, භ

(10) සඤ්ඤක අක්ෂරයක් සහිත වචනයක් නොයෙදුණු වරණය තෝරන්න.

(1) කඳ, සඳ, හිඳ, ඇද (2) ලබය, කඹය, කොහොඹ, කොළඹ

(3) දඟරය, දැඟුල්, සොඬු, සඟමින් (4) නීතිඥ, නාඩා, හැඟීම්, කුඹුරෙන්

(11) සියලු ම පදවල අක්ෂර විනාාසය නිවැරදිව යෙදී ඇති වරණය තෝරන්න.

(1) තෘෂ්ණ, විෂ්ණු, ශුක්ල, ඉෂ්ට

(2) කැලඹුණු, රාමායනය, කුණාටුව, නිකසල

(3) කලරුව්, විභීෂණ, දරපණය, කැළණි

(4) කළමනාකරණ, ප්‍රක්ෂේපන, ක්ෂණික, ආරක්ෂණ

(12) මුලින් දී ඇති ක්‍රියා පද වර්ගයට අයත් නොවන පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) පූර්ව ක්‍රියා - දමා, බලා, නැග, ගොස්

(2) මිශ්‍ර ක්‍රියා - කකා, බසිමින්, දිදී, හැද හැද

(3) විධි ක්‍රියා - බානු, බසින්න, සැනසේවා, හිඳින්

(4) අසම්භාවා ක්‍රියා - යද්දී, ගියොත්, බැලුවොත්, කියන

Department of Education – Western Province

(13) විරුද්ධාර්ථවත් පද යුගලක් නොවන පිළිතුර තෝරන්න.

(1) සාධා - අසාධා (2) සංවෘත - විවෘත

(3) ප්‍රකාර - විප්‍රකාර (4) නුනුවණ - අනුවණ

(14) එකෙණෙහි ස්වාමි දරුවාණෝ මිණි රුවනකට තුඩ දිගු කරන නා රජකු සේ කුමරහු කරා අත දිගු කරන ඇත් රජු දැක "මා පැමිණිවූ මේ වීථියෙහි මේ මද නැගී ඇත්, කිහිබියකට ගහවා මරා පී නමුත්... මෙහි දැක්වෙන උක්ත පද ගණන වනුයේ,

(1) 2 (2) 3 (3) 4 (4) 5

(15) ධාතු ප්‍රකෘතිය වැරදි ලෙස යෙදී ඇති වරණය තෝරන්න.

(1) කඩයි - කඩ (2) බලහි - බල

(3) කෙටුවේය - කොට (4) ඇසුවා ය - අසා

(16) නාම ප්‍රකෘතියක් නොවන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ගස් කුමර, යක්, පුටු (2) සංඝ, දැරිය, කදා, මහලු

(3) අතු. මල්, පන්ති, පැන් (4) මිනිස්, නගර, කැලෑ, සත්

(17) පහත පද්‍ය පාදවල ඉරි ඇඳි පදයේ ව්‍යාකරණ විග්‍රහය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

ළඳේ නිසරු නොකරන් අප සියලා
ස්වර්ණමය යුගයක් ම වූ බව
දිවගත එව් බියෙනැ, ළලෙමිනි දස අත
සැලුණු දැල්ල නිවී ගොස් ය.

(1) උපසර්ග. තද්ධිත, නිපාත, කෘදන්ත (2) නිපාත. තද්ධිත, කෘදන්ත, උපසර්ග

(3) තද්ධිත, කෘදන්ත, නිපාත, උපසර්ග (4) කෘදන්ත, නිපාත, තද්ධිත, උපසර්ග

(18) මුලින් දී ඇති පදයේ අර්ථය නිවැරදිව දක්වා නැති පදයක් අතුළත් වරණය තෝරන්න.

(1) ආතත්මිකව - හේතුවක් නැතිව , පරිශීලනය - හැදෑරීම

(2) පුල්එා ධාන - වේදිකා භූමි , පටිමාසර - පිළිමගෙය

(3) උක්තීන් - කියමන් , හර්ෂය - සතුට

(4) සුනෙර - මහමේරු පර්වතය , තිසයුරා - තිසි අයුරු

Department of Education – Western Province

(19) (1) තීරුවේ සඳහන් කල අර්ථය (2) තීරුවේ දැක්වේ. ඒවා පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

| (1) | (2) |
|---|---|
| 1. කකලවන් | A. කාලහංසය |
| 2. කලගොස් | B. කාලවර්ණ |
| 3. කලරැව් | C. මිහිරි ඝෝෂා ඇත්තා |
| 4. කලහස් | D. පරෙවියා |

(1) BADC (2) BDAC (3) BCAD (4) BCDA

(20) පහත දැක්වෙන ප්‍රාදේශීය ව්‍යවහාරවල පොදු වහර නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

(1) සකලයන් අබනවා - කුරුල්ලන් පැන්නීම (2) පොල් පොත්ත - පොල්ලෙල්ල

(3) නැතුං - අනේ මන්දන්නෑ (4) ඉරිඟු - ඉඟුරු

- අංක 21 සිට 23 දක්වා ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

(21) කවිත්වය නිරායාසයෙන් පහළ නොවේ. එය **නිරතුරුව පුරුදු පුහුණු කිරීමෙන්** සකසා ගත යුත්තකි.

(1) ප්‍රතිභාවෙන් (2) වජ්‍රව පන්තියෙන්

(3) බහුශ්‍රැත භාවයෙන් (4) සතතාභ්‍යාසයෙන්

(22) අපව පරිසරයෙහි. ලෝකයෙහි සොබා දහම හා බැදී **පෙර නොවූ විරූ** දේ සිදුවෙයි.

(1) අපූර්ව (2) පුරාතන (3) අනිගිභවනීය (4) ආතස්මිත

(23) සාමාන්‍ය පාඨකයාට නොපෙනෙන කරුණු කවි බස හැදෑරූ කාව්‍ය රස වින්දනයේ පුරුද්දක් ඇති අයට පෙනේ.

(1) කවියාට (2) පාඨකයාට (3) සහෘදයාට (4) විචාරකයාට

(24) පහත දැක්වෙන වාක්‍යාංශ සඳහා යෙදුණු තනි පද වැරදි ලෙස දැක්වෙන වරණය තෝරන්න.

(1) අන්තයට ගමන් කරන - අන්තගාමී

(2) හේතුව අනුව යමක් සිතීම - අනුමැතිය

(3) දිගු කලක් තුළ සිදුවන වෙනස - පරිණාමය

(4) පරීක්ෂාවට ලක් කරනු පිණිස හරි නැති තාවකාලිකව පිළිගත් මතය

(25) පහත දැක්වෙන පදවලට නොගැළපෙන යුගල පද නිවැරදිව ගැළපූ විට පිළිතුර වන්නේ කුමක් ද?

| | | |
|---|---|---|
| (1) වෘත්තීන් | (අ) | ඉදුම් හිටුම් |
| (2) පිරිසිදු | (ආ) | හැල හැප්පීම් |
| (3) වාසස්ථාන | (ඇ) | රැකී රක්ෂා |
| (4) දුෂ්කරතා | (ඈ) | ශුද්ධ පවිත්‍ර |

(1) අ, ආ, ඇ. ඈ (2) ඇ, අ, ඈ, ආ (3) ඇ, ඈ, අ, ආ (4) ඈ, අ, ආ, ඇ

(26) පහත දී ඇති පද්‍ය පාද අතුරෙන් මෙහි අවසාන පද පේළිය තෝරන්න.

කුඹුයොන් සයුර බොත එහි මිනි සේ අනන
නුබ කැට කෙලෙහි දිසි මෙන් තුරු පහන් වන
සැදෑ සඳුට සදමින් මග නිසා කත
.......................................................................................................

(1) දිවගත එවි බියෙනැ, ලිළෙමිනි දස අත (2) කලදෝ කැට කෙලෙක දිසිවැනි පැහැදිමුන

(3) ඉසි පවන් නිමල් මලිගිය මල් සිය දිමුන (4) පහන් බැවින් විමනට යස ලෙයින වත

(27) වැරදි විභක්තිය සහිත වරනය තෝරන්න.

(1) තත් + අනුබද්ධ (2) සද් + භාවය (3) තත් + භාව (4) සත් + ගුණ

(28) වෙනස් අයුරකින් සන්ධි වූ පදය තෝරන්න.

(1) තුනුවඟ (2) කටුවල (3) රැයකාර (4) තම්පලා

(29) අක්ෂර වින්‍යාසය සම්බන්ධයෙන් වැරදි වූ රීතිය ඇතුළත් වරණය තෝරන්න.

(1) අතීත කාල ක්‍රියා පදවල හා කෘදන්ත රූපවල මූර්දජ "ණ" යෙදේ.

(2) සංස්කෘත වචනවල තාලුජ "ශ" කාරයට පරම "න" යෙදේ.

(3) දන්තජ "න" කාරයට පෙර යෙදෙන "ශ" තාලුජ අක්ෂරයකි.

(4) සමූහාර්ථවාචී පදවල සෑමවිටම යෙදෙන්නේ "ළ" කාරයයි.

Department of Education – Western Province

(30) පහත දැක්වෙන ප්‍රකාශ හා සම්බන්ධ පුද්ගල නාම නිසි පරිදි ගැළපූ විට නිවැරදි වරණය වන්නේ,

- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නලධාරියෙකි.
- සිංහල ජන වහර පිළිබඳ පර්යේෂක මහාචාර්යවරයෙකි.
- පූජිත ජීවිත වෙලුමට ලිපි සැපයූ කතුවරයෙකි.
- ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ නිර්මාණශීලීත්වය පෙන්වූ විශිෂ්ඨ සාහිත්‍යධරයෙකි.

(1) ජේ.බී.දිසානායක, ආනන්ද ගුරුගේ, මහගමසේකර, දෙනගම සිරිවර්ධන

(2) ජේ. ආනන්ද ගුරුගේ, මහගමසේකර, දෙනගම සිරිවර්ධන, ජේ.බී.දිසානායත

(3) ආනන්ද ගුරුගේ, ජේ.බී.දිසානායක, දෙනගම සිරිවර්ධන, මහගමසේකර

(4) මහගමසේකර, ආනන්ද ගුරුගේ, දෙනගම සිරිවර්ධන, ජේ.බී.දිසානායක

(31) යුගල උඩු කොමා, ප්‍රශ්නාර්ථ ලකුණ හා තිත් තුන යන විරාම ලක්ෂණ ඇතුළත් වරණය තෝරන්න.

(1) "ඉතිං සහෝදරයා, අපට ජනතාව වෙනුවෙන් ඒ බලවේග සමග ගැටෙන්නට සිදු වෙනවා."

(2) "නඩුකාරතුමනි, මවක් වශයෙන් මම වින්ද වේදනා හිරිහැර!"

(3) මැත බැලූ බැලූවන් "සාධු! සාධු!" ය කියවන බුදු රජාණෝ යැ.

(4) "ආ.... මට තේරුණා. නායායාම් ක්ෂණිකවම සිදුවෙනවා. හරි නේද මාමේ"?

(32) උපමාවක් නොයෙදුණු වරණය තෝරන්න.

(1) යුගාන්ත වාතයෙන් නැමීයන අඳුන් කුළක් සේ

(2) මෙසේ ම තුන් වාරයක්හිම බුදුන් පසුකොට ඇතු පෙරට වූ සේක

(3) ආකාසයෙහි පිපි වැනී ගිය තරු කුලයක් සේ

(4) කෝපයෙන් රත්වැ ගිය යවට වැනි ඇස් ඇති ඇත් රජු

Department of Education – Western Province

- අංක 33, 34 ප්‍රශ්නවල ප්‍රස්තාව පිරුළුවල අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

(33) ඇඟෙන් ඇටයක් ගියා වගෙයි.

(1) ඉතා කැමැත්තෙන් යමක් දිම (2) ඉතා සතුටින් යමක් දීම

(3) ඉතා අකැමැත්තෙන් යමක් දීම (4) ඉතා ඕනෑකමින් යමක් දීම

(34) කිරියාව හොඳ නම් සිරියාව එතැනයි.

(1) හොඳ හැසිරීම අලංකාරයට හේතු වේ.

(2) ක්‍රියාව සාර්තක නම් ප්‍රතිඵල යහපත් නොවේ.

(3) සාර්ථකත්වය සමඟ යහපත එකතු වේ.

(4) හොඳින් ක්‍රියාත්මක වුවවොත් එතැනට යාමට හැකි වේ.

(35) පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍යය නිවැරදිව කර්ම කාරකයට හරවා ඇති වාක්‍යය තෝරන්න.

හින්දු නිවෙස්වල පිරිමි දරුවෝ සිය සහෝදරියන්ට තෑගි බෝග දෙති.

(1) හින්දු නිවෙස්වල පිරිමි දරුවන් විසින් සිය සහෝදරියන්ට තෑගි බෝග දෙනු ලැබේ.

(2) හින්දු නිවෙස්වල පිරිමි දරුවෝ විසින් සිය සහෝදරීහු හට තෑගි බෝග දෙනු ලැබේ.

(3) හින්දු නිවෙස්වල පිරිමි දරුවන් විසින් සිය සහෝදරීන්ට තෑගි බෝග දෙනු ලැබේ.

(4) හින්දු නිවෙස්වල පිරිමි දරුවෝ අතින් සිය සහෝදරියෝ තෑගි බෝග දෙනු ලැබේ.

- 36 සිට 38 තෙක් ප්‍රශ්නවල ව්‍යාකරනානුකුල නිවැරදි වාක්‍යයක් සඳහා සුදුසු වරනය තෝරන්න.

(36) යටගිය දිවස විසූ ඒ පණ්ඩිත තම අර්ථයෙන් ධර්මයෙන් රජුට අනුශාසනා .................................

(1) කරති (2) කළහ (3) කරයි (4) කළේ ය

(37) කම්කරුවෝ .................................... කානු හාරමින් පාර සකස් කරති.

(1) දෙදෙනෙකු (2) දෙදෙනෙක්

(3) දෙදෙනෙකු විසින් (4) දෙදෙනෙක් විසින්

(38) චාරිකාව යාමට ................................ කල්වේලා ඇතිව විදුහලට පැමිණිය යුතු වේ.

(1) සිසුහු (2) සිසුන් (3) ශිෂ්‍යයෝ (4) සිසු පිරිස

(39) පහත කවියේ හිස්තැන් පිරවීමට සුදුසු පද ඇතුළත් වරණය තෝරන්න.

රුක් අත්තන පෙතන්................ බෝ මී කහට
බක්මී දිවුල් කොළ .............. දාබු මී බට
හික් .............. ලෝලු කොබ්බෑ කුරටි කුමට
අත්වල අග අල්ලනු ............. මුවා කොට

(1) පලු, දඹ, බෝ, මරු (2) පලු, බෝ. මරු, දඹ

(3) පලු, බෝ, දඹ. මරු (4) පලු, දඹ, බෝ, මරු

(40) නුවර කලාපයේ ගොවියා පුල්ලෙයාර් දෙවියන් උදෙසා කිරි ඉතිරවීම ද පවත්නා චාරිත්‍රයකි. මෙහි පුල්ලෙයාර් දෙවියන් ලෙස පිදුම් ලබන්නේ,

(1) විෂ්ණු දෙවියන් ය. (2) අයියනායක දෙවියන් ය.

(3) ගණ දෙවියන් ය. (4) ස්කන්ධ කුමාර ය.

(1 × 40 = ලකුණු 40)

Department of Education – Western Province